සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,110 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 30 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 30 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 01 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් රාජපක්ෂ මොහොට්ටිගේ දෝන ප්‍රියදර්ශනී පුෂ්පකුමාරි වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.05.12 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/9234 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 663, යාය 12, ජයන්තිපුර ලිපිනයේ පදිංචි වේරගොඩ මාස ආරච්චි නෙවිල් රූපසිංහ වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2/5/72/(11), යටතේ 1988.08.15 වැනි දින දී ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමි ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.03.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ/කෝරලේ 70 ජී ජයන්තිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජයන්තිපුර නමැති ගමෙහි පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක පී 17/50, 51, 52, 59 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. පි. පො. 41 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 361 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්. 02, රූඩ්. 02, පර්. 30 විශාලත්වය ඇත්තාවූ ද පහත දක්වා ඇති පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - මඩ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | 348 |
| *නැගෙනහිරට* | : | 362 |
| *දකුණට* | : | 379 |
| *බස්නාහිරට* | : | 359. |

ආර්. එම්. ඩී. පී. පුෂ්පකුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

2018 දෙසැම්බර් මස 24 වැනි දින,

02-173

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/55143.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/DEV/05/WLI/533.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 386, වල්ලිවල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ වල්ලිවල ගමේ මු. පි. මාර. 1922 දරන පිඹුරේ කැබලි අංක 101 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0096ක්වූ රජයේ ඉඩම් කොටස ප්‍රජා ශක්ති සංවර්ධන අරමුදල වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 98 සහ 100, |
| නැගෙනහිරට | : | කැබලි අංක 100 සහ 102, |
| දකුණට | : | කැබලි අංක 102 සහ 137, |
| බටහිරට | : | කැබලි අංක 137 සහ 98. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන්

කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය .-* අවුරුදු පහයි (05). (ගරු ඇමතිතුමා අනුමත කළ 2018.10.02 දින සිට ඉදිරියට),

*වාර්ෂික බදු මුදල.-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කළ 2018 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

(ආ) මෙම ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඇ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2018.10.02 දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්ලිව්. කේ. එන්. නයෝමි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/06 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-172

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/22809.
දකුණු පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය :
ඉකො/14/දීබ/හම්/ලංකා සෝල්ට්.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට නැගෙනහිර අංක 93 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මහ ලේවාය ගමේ මු. පි. හ. 36 පිඹුරේ කැබලි අංක 13, 14, 15 වන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් අක්කර 622, රූඩ් 03, පර්චස් 04ක් වාණිජ කටයුතු සඳහා ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| උතුරට | : | මු. පි. හ. 36 පත්‍ර P 18/2,9,10,11,17,18 හි කැබලි අංක 12 ද, |
| නැගෙනහිරට | : | මු. පි. හ. 36 පත්‍ර P 18/2,9,10,11,17,18 හි කැබලි අංක 12 ද, |
| දකුණට | : | මු. පි. හ. 36 පත්‍ර P 18/2,9,10,11,17,18 හි කැබලි අංක 12 සහ ලේවාගොඩැල්ල ගෙවත්ත ද, |
| බටහිරට | : | මු. පි. හ. 36 පත්‍ර P 18/2,9,10,11,17,18 හි ලේවාගොඩැල්ල ගෙවත්ත සහ කැබලි අංක 12 ද වේ. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය .-* අවුරුදු තිහයි (30). (1994.01.01 දින සිට වසර 30ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1994 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50%ට නොවැඩි විය යුතුය.

*වාර මුදල.-* ඉඩමේ වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 1994.01.01 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එන්. පී. අමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 පෙබරවාරි මස 08 වැනි දින,
අංක 1200/06, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-271

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58153.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/42/1477.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්කසන්තුරෙයි බටහිර ග්‍රාම නිලධාරී වසමේ කන්කසන්තුරෙයි ගමේ අනුරේඛන අංක Tracing No. Ya/TLL/2018/24 හි කැබලි අංක A මගින් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.4281 අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ කටයුතු සඳහා ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

උතුරට, නැගෙනහිරට,
දකුණට සහ බටහිරට : කන්කසන්තුරෙයි සිමෙන්ති කර්මාන්ත ශාලාව හා පරිශ්‍රය - ලංකා සිමෙන්ති සංස්ථාව,

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2019.01.03 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සෙරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2019.01.03 දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 පෙබරවාරි මස 08 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/06, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-378

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.